# සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය
## විධායක නිලධාරීන් සඳහා පුරප්පාඩු

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය මෙරට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහය දැක්වීම සඳහා ප්‍රමුඛ පෙළ මූල්‍ය ආයතන 13ක් සමඟ සම්බන්ධකර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් සහිත ආයතනයකි. ශීඝ්‍රයෙන් වෙනස්වන වෙළඳපොළ ඉල්ලීම්, තාක්ෂණික මාරුවීම් සහ ධාරිතාමය සීමාවන් මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා එල්ලවන අභියෝග ජය ගනිමින්, ආර්ථික වර්ධනය සහ සමෘද්ධිය ප්‍රවර්ධනය කරන ශක්‍ය ව්‍යාපෘතීන් සඳහා මුදල් ප්‍රවාහ මත පදනම් කරගත් ණය ලබාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ණය සුරැකුම් ආයතනය ඇපකර සපයයි.

අප සොයන්නේ ශක්තිමත් අන්තර් පුද්ගල සබඳතා ඇති, සවිස්තරාත්මකව අවධානය යොමුකිරීමට හැකියාව ඇති, රහස්‍යභාවය පවත්වාගැනීමේ හැකියාව ඇති සහ ඉහළ කාර්ය සාධනයක් සහ කණ්ඩායම් සාමාජිකයින් සමග ඉලක්ක සපුරාගැනීමේ හැකියාව ඇති පුද්ගලයන්ය. ඔබ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනයට බලපෑම් කිරීමට සහ වේගවත් කිරීමට කැමති අපේක්ෂකයෙක් නම් අප හා එක්වන්න.

### ප්‍රධාන සුදුසුකම්, පළපුරුද්ද සහ වගකීම්

| | |
|---|---|
| **සුරැකුම් පරිපාලන විධායක නිලධාරී**<br>*ණය සුරැකුම් පරිපාලන ක්‍රියාවලියට පහසුකම් සැලසීම, මූලික ණය විශ්ලේෂණය කිරීම, ණය පදනම යාවත්කාලීන කිරීම, ණය ගැණුම්කරුවන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ සම්බන්ධ වීම, ණය කරුවන් ලියාපදිංචි කිරීම, වාර්තා පවත්වාගෙන යාම සහ වාර්තා ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම මෙහි මූලික වගකීම වේ.* | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වාණිජ, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳව මූලික උපාධියක් හෝ ඊට සමාන ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ වෘත්තීය සුදුසකම් හෝ සාමාජිකත්වය හෝ ACCA, CIMA, CA, CMA හෝ ඊට සමාන සුදුසකමක් පැවතීම.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ හෝ බැංකු/ මූල්‍ය අංශයේ ණය ලබා දීම සම්බන්ධ අවම වසර 2ක පළපුරුද්ද. |
| **හිමිකම් විධායක නිලධාරී**<br>*හිමිකම් ඉල්ලීම්වලට මූලික ඇගයීම් පැවැත්වීම කළමනාකරණයට පහසුකම් සැලසීම, ප්‍රතිසාධන ප්‍රයත්නයන් ඇගයීම , ප්‍රතිසාධන අනුපාත පවත්වා ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන සමග සම්බන්ධ වීම, හිමිකම් / පාඩු ලැබීම් පිළිබඳව වාර්තා කිරීම හා වාර්තා පවත්වාගෙන යාම.* | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය, හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ සුදුසුකම් හෝ වෘත්තීය සමාජිකත්වය හෝ ACCA,CIMA,CA,CMA හෝ ඒ හා සමාන සුදුසුකමක්.<br>• ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය විශ්ලේෂණය හා හිමිකම් ක්‍රියා පටිපාටි පිළිබඳ අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද.<br>• දත්ත විශ්ලේෂණය, වාර්තා කරණය සහ හිමිකම් කළමනාකරණය පිළිබඳව ප්‍රවීණතාවයක් පැවතීම. |
| **මූල්‍ය විධායක නිලධාරී**<br>*සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයේ මූල්‍ය කාර්ය සාධනය සහ ගිණුම්කරණ ගනුදෙනු පිළිබඳ සමස්ත වාර්තා පවත්වාගෙන යාම හා වාර්තා කිරීම, ණය සුරැකුම් ගාස්තු සඳහා ඉන්වොයිසි එක් රැස් කිරීම, හිමිකම් පියවීම සඳහා හිමිකම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වීම , බාහිර විගණක වරුන් සමග සම්බන්ධ වීම හා සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි සියලුම ගිණුම් කනුදෙනු පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම.* | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය, ගිණුම්කරණය හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක් ලබා තිබීම හෝ ACCA,CIMA,CA,CMA හෝ ඒ හා සමාන සුදුසුකමක්<br>• SLFRS සහ අනෙකුත් මූල්‍ය රෙගුලාසිවල නවතම වර්ධනයන් පළිබඳ තාක්ෂණික දැනුමක් පැවතීම.<br>• මූල්‍ය ආයතනයක සමාන තනතුරක අවම වශයෙන් වසර 2ක සේවා පළපුරුද්ද |
| **මූල්‍ය විධායක නිලධාරී – භාණ්ඩාගාර**<br>*මූල්‍ය වත්කම් කළමනාකරණයට සහාය වීම සහ ආයතනයේ ස්ථාවරත්වය සහ වර්ධනය සහතික කිරීම, භාණ්ඩාගාරය ආශ්‍රිත කටයුතු විශ්ලේෂණය, භාණ්ඩාගාර ක්‍රියාකාරකම් පැවැත්වීම සහ භාණ්ඩාගාර ක්‍රියාවලීන් කල්තියා අධීක්ෂණය කිරීම, අයවැය සකස් කිරීමේදී සහය දීම , සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි මූල්‍ය ප්‍රතිපත්ති යහපාලන ප්‍රතිපත්තිවලට අනුකූලවෙමින් මූල්‍ය පරිපාලනයට සහය වීම, සහ අනුකූලතාවය සහ යහපාලනය සහතික කිරීම සඳහා සහාය වීම.* | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක් ලබා තිබීම හෝ CA, ACCA,CIMA,CMA හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.<br>• මුදල් කළමනාකරණය සහ මූල්‍ය ආයතනයක ආයෝජනය පිළිබඳ වසර 2ක අවම පෙර සේවා පළපුරුද්ද. |
| **ප්‍රසම්පාදන විධායක නිලධාරී**<br>*ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සමස්ත කළමනාකරණයට සහාය වීම, ප්‍රසම්පාදන අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රසම්පාදන අයවැය සකස් කිරීම හා සංවර්ධනය කිරීම, සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමග සමපාත වූ ප්‍රසම්පාදන උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ හා සේවා සඳහා මූලාශ්‍ර සොයා ගැනීම හා ගිවිසුම් සඳහා සාකච්ඡා පැවැත්වීම, ප්‍රසම්පාදන අවධානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම.* | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සැපයුම්, සැපයුම් දාම කළමනාකණය, ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳව මූලික උපාධිය.<br>• භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්/ප්‍රසම්පාදනය පිළිබඳව අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද.<br>• මූල්‍ය ආයතනයක ඒ හා සමාන රැකියා භූමිකාවක සහතික කරන ලද රැකියා පළපුරුද්දක් පැවතීම වැඩිදුර සුදුසුකමක් වේ. |
| **තොරතුරු තාක්ෂණ විධායක නිලධාරී**<br>*ජාතික ණය සුරැකුම් ආයතනයෙහි අරමුණු සහ මෙහෙයුම් සමග සමපාත වන තාක්ෂණික උපාය මාර්ග සංවර්ධනයට/ ක්‍රියාත්මක කිරීමට සහාය වීම, දත්ත හා තොරතුරු ආරක්ෂා කිරීමට වගකීම් දැරීම, අභ්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම, අභ්‍යන්තර අයවැය සකස් කිරීම සහ තොරතුරු තාක්ෂණ පිරිවැය කළමනාකරණය කිරීම, තාක්ෂණික විසඳුම් ඒකාබද්ධ කිරීම සඳහා බාහිර තොරතුරු තාක්ෂණ වෙළඳ ආයතන සමග සම්බන්ධීකරණය.* | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, තොරතුරු තාක්ෂණ පද්ධති කළමනාකරණය පිළිබඳව උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>• පිළිගත් ආයතනයක තාක්ෂණ කළමනාකරණය පිළිබඳව අවම වශයෙන් වසර 2ක සේවා පළපුරුද්ද. |

** සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීම් අවසන් වන දිනට වයස අවුරුදු 57ට අඩු විය යුතුය*

### වැටුප් පැකේජ
සියලුම රැකියා ස්ථිර හා පූර්ණ කාලීන තනතුරු වන අතර තෝරාගත් අපේක්ෂකයින් සඳහා ආකර්ෂණීය වැටුප් පැකේජයක් ලබාදෙනු ලැබේ.

### බඳවාගැනීමේ පටිපාටිය
තෝරාගැනීම විස්තීර්ණ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා සිදු කරන අතර, එම ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට පමණක් දැනුම්දීම් කරනු ලැබේ. අදාළ තනතුර සඳහා ඔබ කැමැත්තක් දක්වන්නේනම්, අදාළ සුදුසුකම් ඔබ සතුව තිබේනම්,ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ සබඳතා තොරතුරු සමඟ සම්පූර්ණ කරනලද ජීව දත්ත පත්‍රිකාවක් (PDF) ncgi.recruitment@gmail.com විද්‍යුත් ලිපිනයට යොමුකර එහි දෘඩ පිටපතක් 2024 සැප්තැම්බර් 11 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. කරුණාකර ලියුම් කවරයේ සහ විද්‍යුත් පණිවිඩයෙහි විෂය, ''NCGIL - යේදී ඇති තනතුරේ නම'' සඳහන් කරන්න.

***ලිපිනය: ජාතික ණය සුරැකුම් ආයතනය, කාමර අංක 207, මහ ලේකම් කාර්යාලය, 2 මහළ, ලෝටස් පාර, කොළඹ 01***